5076

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) 12 ශ්‍රේණිය තෙවන වාර පරීක්ෂණය, 2018 ජූලි
கல்விப் பொதுத் தராதர (உயர்தரப்) பரீட்சை 2018 ஜூலை, தரம் 12 மூன்றாம் தவணைப் பரீட்சை
General Certificate of Education (Adv. Level), Grade 12 Third Term Test, 2018

ගිණුම්කරණය - I
Accounting - I

33 S I

පැය දෙකයි
Two hours

විභාග අංකය: ....

උපදෙස්:
- අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
- අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
- සෑම ප්‍රශ්නයකට ලකුණු දෙක බැගින් හිමි වේ.

I පත්‍රය සඳහා

ප්‍රශ්න අංකය	ලකුණු
01 - 30	
31 - 50	
එකතුව	

01. පහත දක්වා ඇති කුමන ප්‍රකාශය ආයතනයක මූල්‍ය ගිණුම්කරණයේ මූලික කාර්යභාරය විස්තර කරයිද?
   1. ආයතනයක සියලුම ගනුදෙනු ගිණුම් පොත් වල සටහන් කිරීම.
   2. ආයතනයක ගනුදෙනු වල සවිස්තරාත්මක විශ්ලේශණයක් කළමණාකරුවන්ට සැපයීම.
   3. ආයතනයක් පිළිබඳ තොරතුරු එය භාවිතා කරන පාර්ශවයන් වෙත තීරණ ගැනීම සඳහා සැපයීම.
   4. ආයතනයක ගනුදෙනු සටහන් කිරීම, වර්ග කිරීම හා සාරාංශ කිරීම.
   5. ආයතනයක මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති තොරතුරු විශ්ලේෂණය කිරීම. (........)

02. රු. 65, 000 ක පිරිවැය වූ, පලුදු භාණ්ඩ තොගයක් රු. 50, 000ක ණයට විකුණන ලදී. මෙමගින් ව්‍යාපාරයේ,

	වත්කම්	හිමිකම්
1.	රු. 15 000 අඩු වේ.	රු. 15 000 අඩු වේ.
2.	රු. 15 000 වැඩි වේ.	රු. 15 000 වැඩි වේ.
3.	රු. 65 000 අඩු වේ.	රු. 65 000 අඩු වේ.
4.	රු. 65 000 වැඩි වේ.	රු. 65 000 වැඩි වේ.
5.	රු. 50 000 අඩු වේ.	රු. 50 000 අඩු වේ.

(........)

03. පහත තොරතුරු ගිණුම්කරණ ක්‍රියාවලියේදී සිදුවන නිවැරදි අනුපිළිවෙළ වන්නේ,
   A මූලික ලියවිල්ල පිළියෙල කිරීම.
   B එම ලියවිල්ල පොත් වල සටහන් කිරීම.
   C මූලික පොත්වලින් ලෙජරයට පිටපත් කිරීම.
   D ගනුදෙනු සිදු වීම.

   1. ABCD   2. ADBC   3. DBCA   4. DABC   5. ADCB (........)

04. නිමි ඇඳුම් නිෂ්පාදන ව්‍යාපාරයකට අදාල පහත ගනුදෙනු සටහන් කිරීමට අවශ්‍ය මූලික සටහන් පොත් අනුපිළිවෙලින් දක්වෙන ප්‍රකාශය කුමක්ද?

A නිමි ඇඳුම් සඳහා අමුද්‍රව්‍ය වශයෙන් රු. 780 000 රෙදි තොගයක් ණයට මිලදී ගැනීම.

B රු. 240 000 නූල් තොගයක් ඇණවුමට පටහැනි නිසා හරවා යැවීම.

C ප්‍රවාහන කටයුතු සඳහා රු. 1000 000 ලොරි රථයක් ණයට මිලදී ගැනීම.

D රු. 150 000 වැටුප් ගෙවීම.

1. ගැනුම් ජ'නලය, ආපසු යැවුම් ජ'නලය, පොදු ජ'නලය, මුදල් පාලන ගිණුම
2. මුදල් පාලන ගිණුම, ආපසු යැවුම් ජ'නලය, පොදු ජ'නලය, මුදල් පාලන ගිණුම
3. ගැනුම් ජ'නලය, ආපසු යැවුම් ජ'නලය, පොදු ජ'නලය, පොදු ජ'නලය
4. පොදු ජ'නලය, ආපසු යැවුම් ජ'නලය, පොදු ජ'නලය, මුදල් පාලන ගිණුම
5. ගැනුම් ජ'නලය, ආපසු යැවුම් ජ'නලය, මුදල් පාලන ගිණුම, පොදු ජ'නලය (........)

05. ව්‍යාපාරයේ මුදලින්, අයිතිකරුගේ පෞද්ගලික වියදම් දැරීම හිමිකමේ අඩු වීමක් ලෙස හඳුනාගනු ලබන්නේ කුමන ගිණුම්කරණ සංකල්පයට අනුවද?

1. ගැලපුම් 2. කාලච්ඡේද 3. උපචිත 4. අඛණ්ඩ පැවැත්ම
5. ඒකක (........)

06. ව්‍යාපාරයක පහත ගනුදෙනු සිදු විය,

A රු. 100 000ක භාණ්ඩ විකුණන ලද අතර එය විකුණුම් ආදායමක් ලෙස හඳුනා ගැනීම.

B ණයගැතියන් සඳහා අඩමාණ ණය වෙන් කිරීමක් සිදු කිරීම.

C මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කරන දිනට ණයගැතියෝ වත්කමක් ලෙස හඳුනා ගැනීම.

ඉහත ගනුදෙනු හා සිදුවීම් සඳහා පදනම් වන වඩාත් ගැලපෙන ගිණුම්කරණ සංකල්ප වල අනුපිළිවෙල වන්නේ,

1. උපලබ්ධි, ඒකක, අඛණ්ඩ පැවැත්ම
2. උපලබ්ධි, ආරක්ෂණ, උපචිත
3. මූල්‍ය මිනුම්, ආරක්ෂණ, ඒකක
4. යථාරූපී, උපලබ්ධි, උපචිත
5. උපචිත, ප්‍රමාණාත්මක, අඛණ්ඩ පැවැත්ම (.........)

07. ව්‍යාපාරයක් විසින් එහි සේවකයින්ට ලබා දෙන දීමනා මූල්‍ය ප්‍රකාශන තුල හෙළි දරව් කිරීම සඳහා පදනම් වන ගිණුම්කරණ සංකල්පය වන්නේ,

1. උපලබ්ධි
2. අඛණ්ඩ පැවැත්ම
3. ප්‍රමාණාත්මක බව
4. සංගතතාවය
5. ගැළපුම් (........)

08. ව්‍යාපාරයක් 2018.03.31 දිනට පිළියෙළ කල ශේෂ පිරික්සුම සම නොවිය. එය නොසලකා ශුද්ධ ලාභය ගණනය කර තිබුණි. පසුව පහත වැරදි සොයා ගන්නා ලදී.

රු. 60 000 ක ණයට විකුණුම් ණයගැති පාලන ගිණුමට පමණක් හර කර ඇත.

රු. 10 000 ක දුන් වට්ටම්, ලද වට්ටම් ගිණුමට බැර කර ඇත. නමුත් එය ණයගැති පාලන ගිණුමේ නිවැරදිව සටහන් කර ඇත.

ඉහත වැරදි නිසා ගණනය කර ඇති ශුද්ධ ලාභයට සිදු වී ඇති බලපෑම වන්නේ,

1. රු. 20 000 කින් අධිතක්සේරු වී ඇත.
2. රු. 25 000 කින් අවතක්සේරු වී ඇත.
3. රු. 70 000 කින් අවතක්සේරු වී ඇත.
4. රු. 40 000 කින් අවතක්සේරු වී ඇත.
5. රු. 50 000 කින් අවතක්සේරු වී ඇත. (........)

09. පහත සඳහන් කුමන ප්‍රකාශය ණයගැති පාලන ගිණුමට අදාලව නිවැරදි වේද?

1. සෑම ණයගැතියෙක් වෙනුවෙන්ම පාලන ගිණුමක් පවත්වාගෙන යයි.
2. සියලුම විකුණුම් ණයගැති පාලන ගිණුමේ සටහන් කරයි.
3. අඩමාණය ණය වෙන් කිරීම ණයගැති පාලන ගිණුමේ සටහන් කරයි.
4. ණයගැතියන්ට දුන් වට්ටම් ණයගැති පාලන ගිණුමේ සටහන් නොකරයි.
5. සියලුම වෙළෙඳ ණය ගැතියන් වෙනුවෙන් පාලන ගිණුමක් පවත්වාගෙන යයි. (........)

10. පහත සඳහන් තොරතුරු ව්‍යාපාරයක 2018 මාර්තු මාසයට අදාල වේ.

ගණුදෙනුවේ ස්වභාවය	ලකුණු කළ මිල	වෙළඳ වට්ටම්
මුදලට	2000	15%
ණයට	4000	10%

ඉහත ණය හිමියන් පියවීමේදී 5% වට්ටමක් ව්‍යාපාරයට හිමිවේ නම්, මෙම තොරතුරු වාර්තා කිරීමට අදාළ ද්විත්ව සටහන වනුයේ,

හර	බැර
1. ණය හිමි පාලන ගිණුම 4150	මුදල් පාලන ගිණුම 4150
2. ණය හිමි පාලන ගිණුම 3800	මුදල් පාලන ගිණුම 3800
3. මුදල් පාලන ගිණුම 3420 දුන් වට්ටම් ගිණුම 180	ණය හිමි පාලන ගිණුම 3600
4. ණය හිමි පාලන ගිණුම 3600	මුදල් පාලන ගිණුම 3600
5. ණය හිමි පාලන ගිණුම 3600	මුදල් පාලන ගිණුම 3420 ලද වට්ටම් ගිණුම 180

(........)

11. "සමනල" ව්‍යාපාරය තොග වෙළඳාමේ නියුතු ව්‍යාපාරයකි. "අසිත ව්‍යාපාරය" ඉහත ව්‍යාපාරයේ ප්‍රධාන ගණුදෙනුකරුවෙකි. ව්‍යාපාර දෙකම VAT සඳහා ලියාපදිංචිව ඇත. "සමනල" ව්‍යාපාරය විසින් ලකුණු කල මිල රු. 800,000 වූ භාණ්ඩ තොගයක් 10% ක වට්ටමකට යටත්ව "අසිත" ව්‍යාපාරයට විකුණන ලදී. එහි VAT අගය 15% කි. එම ගණුදෙනුව සමනල ව්‍යාපාරයේ පොත් වල වාර්තා කල යුත්තේ,

1. ණයගැති පාලන ගිණුම හර 828,000
   VAT පාලන ගිණුම බැර 108,000
   විකුණුම් ගිණුම බැර 720,000
2. ණයගැති පාලන ගිණුම හර 920,000
   VAT පාලන ගිණුම බැර 120,000
   විකුණුම් ගිණුම බැර 800,000
3. ගැනුම් ගිණුම හර 920,000
   VAT පාලන ගිණුම බැර 120,000
   ණය හිමි පාලන ගිණුම බැර 800,000
4. ණයගැති පාලන ගිණුම හර 800,000
   විකුණුම් ගිණුම බැර 800,000
5. ණයගැති පාලන ගිණුම හර 936,000
   VAT පාලන ගිණුම බැර 108,000
   විකුණුම් ගිණුම බැර 828,000

(........)

12. ඉහත 11 ප්‍රශ්නයට අදාළ ගණුදෙනුව "අසිත" ව්‍යාපාරයේ සටහන් කිරීමේදී ගැනුම් වටිනාකම සහ VAT පාලන ගිණුමේ ඇතුලත් විය යුතු වටිනාකම පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

1. රු. 800 000 සහ රු. 120 000කි.
2. රු. 920 000 සහ රු. 120 000 කි.
3. රු. 720 000 සහ රු 108 000 කි.
4. රු. 800 000 සහ රු 80 000කි
5. රු. 720 000 සහ රු. 120 000 කි.

(........)

● ප්‍රශ්න අංක 13,14 ට පිළිතුරු සැපයීම සඳහා පහත තොරතුරු භාවිතා කරන්න. ව්‍යාපාරයක් විසින් අත්පත් කර ගන්නා ලද යන්ත්‍ර කිහිපයක් පිළිබඳ තොරතුරු පහත දක්වේ.

යන්ත්‍ර අත්පත් කර ගත් දිනය	පිරිවැය	සුන්බුන් අගය	ජීව කාලය
2017/07/01	1200,000	—	6
2017/10/01	800,000	200,000	10
2017/12/31	600,000	100,000	5

13. 2018/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉහත වත්කම් වලට අදාල ධාරණ අගය සහ ක්ෂය වෙන් කිරීමේ ගිණුමේ ශේෂය පිළිවෙලින්,

1. රු. 2600 000 සහ රු. 360 000
2. රු. 2600 000 සහ රු. 205 000
3. රු. 2395 000 සහ රු. 205 000
4. රු. 2395 000 සහ රු. 360 000
5. රු. 2495 000 සහ රු. 205 000

(........)

14. ඉහත ගණුදෙනු වාර්තා නොකිරීම තුලින් ව්‍යාපාරයේ ශුද්ධ ලාභයට කරන බලපෑම වන්නේ,

1. ව්‍යාපාරයේ ශුද්ධ ලාභය රු. 360,000 අඩු වීමයි.
2. ව්‍යාපාරයේ ශුද්ධ ලාභය රු. 205,000 වැඩි වීමයි.
3. ව්‍යාපාරයේ ශුද්ධ ලාභය රු. 360,000 වැඩි වීමයි.
4. ව්‍යාපාරයේ ශුද්ධ ලාභය රු. 205,000 අඩු වීමයි.
5. ව්‍යාපාරයේ ශුද්ධ ලාභය රු. 265,000වැඩි වීමයි. (........)

15. 2017.04.01 දින විස්මි හා නිපුනි හවුල් ව්‍යාපාරයකට එළඹුනු අතර, හවුල් ව්‍යාපාර ගිවිසුමෙහි එකඟතා පහත පරිදි වේ.

A එක් හවුල් කරුවෙකුට රු. 100,000ක වාර්ෂික වේතනයක් හිමිය.

B ප්‍රාග්ධන ශේෂ මත 10% ක වාර්ෂික පොළියක් හිමිය.

C ලාභ අලාභ සමානව බෙදා ගැනීම.

ප්‍රාග්ධනය ලෙස විස්මි හා නිපුනි රු. 400,000ක් බැගින් යොදවන ලදි. 2018.03.31 න් අවසන් වර්ෂයේ දී රු. 360,000ක ශුද්ධ ලාභයක් උපයා ඇත. 2018.03.31 දින අවිශ්කා නව හවුල්කරුවෙකු ලෙස බඳවා ගන්නා අතර, ඇය රු. 400,000ක මුදලක් ප්‍රාග්ධනය ලෙස රැගෙන ආවේය. මෙදිනට ව්‍යාපාරයේ කීර්ති නාමය රු. 120,000කට තක්සේරු කර එය ප්‍රාග්ධන ගිණුම් තුළින් ගලපන ලදි. ගිවිසුමේ කොන්දේසි එලෙසින්ම පවත්වා ගැනීමට එකඟ විය. 2018.03.31 දිනට හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් ශේෂය කොපමණද?

	විස්මි	නිපුනි	අවිශ්කා
1.	420,000	420,000	360,000
2.	420,000	420,000	280,000
3.	540,000	540,000	280,000
4.	460,000	460,000	400,000
5.	460,000	460,000	360,000

(........)

16. විස්මි හා නිපුනි ඔවුන්ට හිමි හවුල් වේතන මුදලින් ලබා ගත්තේ නම්, 2018.03.31 දිනය ජංගම ගිණුම් ශේෂයන් කොපමණද?

	විස්මි	නිපුණි
1.	180 000	180 000
2.	80 000	80 000
3.	40 000	40 000
4.	140 000	140 000
5.	නැත	නැත

(........)

17. ව්‍යාපාරයක නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමේදී පහත දක්වෙන වැරදි සිදු වී ඇත. නිෂ්පාදන පිරිවැය රු. 890,000 වූ අතර නිෂ්පාදනය ඒකක 10,000ක් විය.

A - අවසන් නොනිමි ද්‍රව්‍ය තොගය රු. 90,000 අඩුවෙන් වාර්තා කර තිබුනි.

B - කම්හල් කුලී වශයෙන් ගෙවූ රු. 200,000 වටිනාකම වර්ෂ දෙකකට අදාල වන අතර, මුළු වටිනාකම නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමේ දී ඇතුළත් කොට ඇත.

ඉහත ගණුදෙනු වාර්තා කිරීමෙන් පසු ව්‍යාපාරයේ නිවැරදි නිෂ්පාදන පිරිවැය සහ ඒකක නිෂ්පාදන පිරිවැය පිළිවෙළින්,

1. රු. 800,000 සහ රු. 80 විය යුතුය.
2. රු. 900,000 සහ රු. 90 විය යුතුය.
3. රු. 790,000 සහ රු. 79 විය යුතුය.
4. රු. 890,000 සහ රු. 89 විය යුතුය.
5. රු. 700,000 සහ රු. 70 විය යුතුය. (........)

18. යෝගට් නිෂ්පාදනය කරන "රසාර ව්‍යාපාරයේ" 2018.03.31 දිනෙන් අවසන් වසරේ නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමේදී පහත අයිතම සැලකිල්ලට ගෙන නැත.

යන්ත්‍ර ක්ෂය රු. 2000

යෝගට් බහාළුම් පිරිවැය රු. 3000

නරක් වූ කිරි වල පිරිවැය රු. 500

සේවකයින්ට ගෙවූ ප්‍රසාද දීමනා රු. 1000 (නිෂ්පාදනය මත ගෙවන ලද)

මෙම අයිතම සැලකිල්ලට නොගැනීම නිසා නිෂ්පාදන පිරිවැයට සිදු වී ඇති බලපෑම වනුයේ,

1. රු. 5500 කින් අඩු වීම.
2. රු. 6000 කින් වැඩි වීමයි.
3. රු. 6500 කින් අඩු වීමයි.
4. රු. 6000 කින් අඩු වීමයි.
5. රු. 5500 කින් වැඩි වීමයි. (........)

19. සමීරගේ ව්‍යාපාරයේ 2018 මාර්තු මාසය සඳහා සුළු මුදල් වියදම රු. 3750කි. මාර්තු මාසය අග ප්‍රතිපූර්නය කරන ලද මුදල රු. 5250කි. පෙර මසට වඩා රු. 1,500කින් මෙම මස අග්‍රිමය වැඩි කර තිබුනේ නම්, මාර්තු මාසයේ 01 වන දිනට පැවති සුළු මුදල් ශේෂය හා එදිනට අදාල සුළු මුදල් අග්‍රිමය කොපමණද?

1. රු. 1500 සහ රු. 6750
2. රු. 3750 සහ රු. 5250
3. රු. 3750 සහ රු. 3750
4. රු. 3750 සහ රු. 6750
5. රු. 1500 සහ රු. 5250 (........)

20. "යශෝදරා" කාන්තා සවිබල ගැන්වීමේ සංවිධානයේ 2017.04.01 දිනට පැවති හිමිකම් පහත දක්වේ.

	(රු.'000)
සමුච්චිත අරමුදල	180
ගොඩනැගිලි අරමුදල	700
යාවජීව සාමාජික මුදල	30
	910

2018.03.31 දිනෙන් අවසන් වර්ෂය තුල ගොඩනැගිලි අරමුදලින් රු. 30000ක් භාවිතා කොට ගොඩනැගිලි නවීකරණය කර ඇති අතර යාවජීව සාමාජික මුදලින් රු. 10000ක් වසරේ ආදායම් ප්‍රකාශයට මාරු කර ඇත. ඉහත ගණුදෙනු වලින් පසුව 2018.03.31 දිනෙන් අවසන් වර්ෂයේ අතිරික්තය රු. 20000කි.

2018.03.31 දිනට සංගමයේ මුලු හිමිකම් වල වෙනස කෙසේ වේද?

1. රු. 10000 කින් වැඩි වේ.
2. රු. 20000 කින් අඩු වේ.
3. රු. 30000 කින් අඩු වේ.
4. රු. 10000 කින් අඩු වේ.
5. රු. 20000 කින් වැඩි වේ.

(........)

21. පහත සඳහන් එක් එක් අවස්ථාව සඳහා වඩාත් යෝග්‍ය වන ගිණුම්කරණ සංකල්පය අනුපිළිවෙලින් සඳහන් පිළිතුර කුමක්ද?

A දේපල පිරියත හා උපකරණ පිරිවැයට හඳුනා ගැනීම.

B මූල්‍ය ප්‍රකාශන වල කාලච්ඡේදය සඳහන් කිරීම.

C කල්බදු දේපල ව්‍යාපාරයේ වත්කම් ලෙස හඳුනා ගැනීම.

D හවුල්කරුවන්ගේ හිමිකම් ප්‍රාග්ධන ගිණුමේ හා ජංගම ගිණුමේ වාර්තා කිරීම.

1. ඓතිහාසික පිරිවැය, කාලච්ඡේද, මූල්‍ය මිනුම්, ගැලපුම්
2. මූල්‍ය මිනුම්, කාලච්ඡේද, ඓතිහාසික පිරිවැය, ගැලපුම්
3. ඓතිහාසික පිරිවැය, කාලච්ඡේද, යථාරූපී, ඒකක
4. මූල්‍ය මිනුම්, අඛණ්ඩ පැවැත්ම, යථාරූපී, ඒකක
5. අඛණ්ඩ පැවැත්ම, ආරක්ෂණ, සංගතතාවය, අනාවරණ

(........)

22. නිෂ්පාදන ව්‍යාපාරයකට අදාලව දරණ ලද පහත දක්වෙන කුමන පිරිවැය අයිතම සෘජු පිරිවැය ලෙස වර්ග කෙරේද?

A අමුද්‍රව්‍ය කම්හලට ගෙන ඒමට දරන ලද ප්‍රවාහන පිරිවැය

B කම්හලේ යන්ත්‍ර සඳහා ගලපන ලද ක්ෂය වියදම

C නිෂ්පාදන කළමණාකරුගේ මාසික වැටුප

D නිෂ්පාදන ඒකක මත ගෙවන ලද සේවක වේතන

E මෝස්තර නිර්මාණ ශිල්පියාට ගෙවන ලද පුරස්කාරය

1. A, C සහ E පමණි.
2. B, C සහ D පමණි.
3. C, D සහ E පමණි.
4. A, D සහ E පමණි.
5. B, C සහ E පමණි.

(........)

23. ජයතුගේ ව්‍යාපාරයේ 2018 අප්‍රේල් මාසය සඳහා මුළු ණයට විකිණුම රු. 8000 වූ අතර මෙහි වෙළෙඳ වට්ටම් 10% කි. ඉන් $\frac{1}{4}$ ක් ඇණවුමට පටහැනි බැවින් ආපසු හරවා එවන ලදී. ණයගැතියන් මාසය තුළ ණයපියවීමේ ප්‍රතිශතය 50% නම්, මාසය අවසානයේ මුදල් ලැබීම් ජනලයේ සටහන් වන ණයගැති ලැබීම් ප්‍රමාණය කොපමණද?

1. රු. 2700 කි.
2. රු. 7200 කි.
3. රු. 3600 කි.
4. රු. 4200 කි.
5. රු. 2400 කි.

(........)

24. "ගිණුම්කරණ තොරතුරු විවිධ අවශ්‍යතා සඳහා විවිධ පාර්ශව භාවිත කරයි." මෙම ප්‍රකාශයට අනුව A හා B කාණ්ඩ නිවැරදිව ගලපා ඇති ප්‍රකාශය කුමක්ද?

A	B
කළමණාකරුවන්	W තම රැකියාවේ සුරක්ෂිත භාවය
අයිතිකරුවන්	X අනාගත සැලසුම් හා ප්‍රතිපත්ති තීරණය කිරීම සඳහා
සේවකයින්	Y සපයා ඇති ණය වල සුරක්ෂිතභාවය තහවුරු කිරීම
මූල්‍ය ආයතන	Z යොදවා ඇති ප්‍රාග්ධනය ප්‍රමාණවත්වේද යන්න විමසා බැලීම

1. XYWZ
2. YZXW
3. YWZX
4. XZWY
5. XZYW

(........)

25. 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපාරයක පහත තොරතුරු දී ඇත.

	රු.
වෙළෙඳ භාණ්ඩ ණයට ගැණුම්	700000
ණයහිමියන්ගෙන් ලද වට්ටම	65000
ණයගැතියන්ට හිලව් කිරීම	20000
ආපසු යැවුම්	35000
ණයහිමියන් අයකල පොළී	20000

2018.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ ණය හිමියන්ට ගෙවූ මුදල කොපමණද?

1. රු. 580 000
2. රු. 600 000
3. රු. 680 000
4. රු. 640 000
5. රු. 620 000

(........)

26. දුටුගැමුණු ක්‍රීඩා සමාජයේ සාමාජික මුදල් වලට අදාල තොරතුරු පහත දක්වේ.

	2017.03.31	2018.03.31 දිනට
ඉදිරියට ලද සාමාජික මුදල්	20000	?
ලැබිය යුතු සාමාජික මුදල්	?	15000

2017/18 වර්ෂයේදී ලද සාමාජික මුදල්

2016/17 වර්ෂය සඳහා	රු. 10000
2017/18 වර්ෂය සඳහා	රු. 55000
2018/19 වර්ෂය සඳහා	රු. 15000
	රු. 80000

2018.03.31 අවසන් වර්ෂය සඳහා හඳුනාගත යුතු සාමාජික මුදල් ආදායම කොපමණද?

1. රු. 80000 යි.
2. රු. 90000 යි.
3. රු. 55000 යි.
4. රු. 70000 යි.
5. රු. 95000 යි.

(........)

27. විශල්ගේ ව්‍යාපාරයේ 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු දී ඇත.

රු.

2017.04.01 දිනට මුළු ශුද්ධ වත්කම 3875 000

2018.03.31 දිනට මුළු ශුද්ධ වත්කම 7550 000

කාලච්ඡේද තුල මුළු වියදම රු. 2400 000කි.

කාලච්ඡේදයේ මුළු ආදායම රු. 3950 000කි.

වර්ෂය තුල සිදු කල ගැනිලි රු. 50 000ක් නම් ගිණුම් කාලච්ඡේද තුල කොපමණ අතිරේක ප්‍රාග්ධනයක් යොදවා තිබේද?

1. රු. 1550
2. රු. 1025
3. රු. 2075
4. රු. 2175
5. රු. 2025

(........)

28. ව්‍යාපාරයක 2018.03.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ ණයගැතියන් සම්බන්ධ තොරතුරු පහත දී ඇත.

	රු.
2017.04.01 දිනට ණයගැති ශේෂය	2000
2017/2018 වර්ෂය තුල ණයට විකුණුම්	3000
වර්ෂය තුළ කපා හල බොල් ණය	300
පෙර වර්ෂයේ කපා හල බොල් ණය ආපසු ලැබීම	50

සෑම වර්ෂයකම අවසාන ණයගැති ශේෂය මත 5%ක් අඩමාණ ණය ලෙස වෙන් කෙරේ. 2018.03.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගන්නා බොල් ණය හා අඩමාණ ණය වටිනාකම පිළිවෙලින්,

1. රු. 250 සහ රු. 135 කි.
2. රු. 300 සහ රු. 135 කි.
3. රු. 300 සහ රු. 150 කි.
4. රු. 250 සහ රු. 150 කි.
5. රු. 235 සහ රු. 300 කි.

(........)

29. ව්‍යාපාරයක සේවකයින්ට 2018 ජනවාරි මාසය සඳහා ගෙවන ලද වැටුප් පිළිබඳව විස්තරයක් පහත දක්වේ. මූලික වැටුප රු. 200,000ද, දීමනා රු. 50,000 ද වේ. E . P . F සඳහා සේව්‍ය හා සේවක දායකය පිළිවෙලින් 15% සහ 10% කි. E . T . F දායකය 3% කි. ඉහත තොරතුරු වලට අනුව ව්‍යාපාරයේ සේවකයින්ට අදාල මුළු වියදම සහ ගෙවිය යුතු E . P . F ගිණුමේ ශේෂය පිළිවෙලින් දක්වා ඇත්තේ,

1. රු. 286,000 සහ රු. 50,000
2. රු. 250,000 සහ රු. 50,000 කි.
3. රු. 280,000 සහ රු. 36,000
4. රු. 256,000 සහ රු. 56,000
5. රු. 230,000 සහ රු. 26,000

(........)

30. සේවා ව්‍යාපාරයක් පවත්වාගෙන යන "නිහාල්" පහත තොරතුරු ඔබ වෙත සපයයි.

	(රු.'000)
2017.04.01 දින ලැබිය යුතු සේවා ආදායම	300
මුදලින් ලද සේවා ආදායම	3000
2018.03.31 දිනට ලැබිය යුතු සේවා ආදායම්	700
2018.03.31 දිනට ඉදිරියට ලද සේවා ආදායම්	200
ගෙවූ සේවා වියදම්	1800
2018.03.31 දිනට ගෙවිය යුතු වියදම්	200

උපචිත පදනම මත හඳුනාගත යුතු ලාභය වන්නේ,

1. රු. 2100 2. රු. 1200 3. රු. 1500 4. රු. 1700
5. රු. 1800 (........)

31. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය/අසත්‍යතාව දක්වන්න.
1. කළමණාකරණ ගිණුම්කරණයේදී අතීත තොරතුරු හා පුරෝකථන තොරතුරු භාවිතා කරයි. ....
2. මූල්‍ය ගිණුම්කරණය භාහිර පාර්ශව වෙත පමණක් තොරතුරු ඉදිරිපත් කරයි ....
3. මූල්‍ය ගිණුම්කරණය හා කළමණාකරණ ගිණුම්කරණය, නීතිරීති හා ප්‍රමිති භාවිතා කරයි. ....
4. කළමණාකරණ ගිණුම්කරණය අවශ්‍ය සෑමවිටකදීම අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කරයි ....

32. පහත සඳහන් ගනුදෙනු වල බලපෑම ධන (+) හෝ සෘණ () ලකුණු සහිතව දී ඇති මූලිකාංග වල නිරූපණය කරන්න. (වටිනාකම සහිතව)

	වත්කම්	=	හිමිකම + වගකීම්
A - පිරිවැය 40, 000 තොගයක් 50, 000 ට විකුණා ලද මුදල	....		............+ ....
B - ගෙවිය යුතු විදුලි ගාස්තු (උපචිත) වු රු. 5000 මුදලින් ගෙවීම	....		............+ ....

33. පහත සඳහන් ගිණුම් වත්කම්, වගකීම්, ආදායම්, වියදම්, හිමිකම් ලෙස වර්ගීකරණය කරන්න.
A හවුල්කරුවන්ගේ ජංගම ගිණුම ....
B විකුණුම් පිරිවැය ....
C ක්ෂය වෙන් කිරීම ....
D ලද අත්තිකාරම ....

34. 2018.01.31 දිනට ව්‍යාපාරයක මුදල් පාලන ගිණුමේ ශේෂය රු. 188 000 කි. නමුත් එදිනට බැංකු ප්‍රකාශයට අනුව ශේෂය රු. 318,000 විය. බැංකු ප්‍රකාශයට අනුව ශේෂය, මෙසේ වැඩි අගයක් ගැනීමට හේතු විය හැකි කරුණු 02ක් ලියා දක්වන්න.
(i) ....
(ii) ....

35. පොදු ලෙජරයේ ගනුදෙනු වාර්තා කිරීමේදී 1) .... ක්‍රමය අනුගමනය කරන අතර, උප ලෙජරයේ දී 2) .... ක්‍රමය අනුගමනය කරයි.

36. ලාභ අරමුණු කර නොගත් සංවිධානයකට අදාළව, පහත ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න සඳහන් කරන්න.
A ලැබීම් හා ගෙවීම් ගිණුම, මුදල් පදනම් මත පිළියෙල කරයි. (..........................)
B මුළු වත්කම් වලින් මුළු වගකීම අඩුකළ පසු සමුච්චිත අරමුදල ලැබේ. (..........................)
C කාලච්ඡේදයක් තුල ලද සියලුම සාමාජික මුදල් එම කාලච්ඡේදයේ ආදායමක් ලෙස හඳුනා ගැනේ. (..........................)
D සියලුම පරිත්‍යාග සෑම විටම එය ලද වර්ෂයේ ආදායමක් ලෙස වාර්තා කරයි. (..........................)

37. 2018.01.31 දින ඇති වූ ගංවතුරකින් තොග වෙළෙඳ ව්‍යාපාරයක, ගිණුම් අංශයේ සියලුම පොත්පත් ද වෙළෙඳ අංශයේ පැවති තොගයද සම්පූර්ණයෙන්ම විනාශයට පත් විය. පහත තොරතුරු පමණක් ලබා ගත හැකි විය.

	(රු.'000)
ගැනුම්	1200
විකුණුම්	2000

2018.01.01 දින පැවති වෙළඳ තොග වටිනාකම රු. 300 කි.
විකුණුම් පිරිවැය මත දළ අනුපාතය 60% කි.
1. අවසාන තොගය කොපමණද? ....
2. දළ ලාභය කීයද? ....

38. පහත සඳහන් එක් එක් අවස්ථාවට වඩාත් අදාල වන ගිණුම්කරණ සංකල්පය සඳහන් කරන්න.

ගිණුම්කරණ සංකල්පය

A කළමණාකරණ දක්ෂතා මූල්‍ය ප්‍රකාශන වල හඳුනා නොගැනීම ....

B මුදලේ අගය ස්ථාවරව පවතී යැයි උපකල්පනය කිරීම ....

C විකුණුම් අත්තිකාරම් විකුණුම් ලෙස හඳුනා නොගැනීම ....

D හවුල්කරුවන්ගේ සියළු ගැලපුම් ප්‍රාග්ධන හා ජංගම ගිණුම්වල පමණක් සිදු කිරීම. ....

39. ඓතිහාසික පිරිවැය සංකල්පය, ආරක්ෂණ සංකල්පය සමඟ නොගැලපෙන අවස්ථා 02 ක් ලියන්න.

1. ....

2. ....

40. 3:2 අනුපාතයට අනු හා මනු විසින් පවත්වාගෙන ගිය හවුල් ව්‍යාපාරයට නව හවුල් කරුවෙකු ලෙස දිනු බඳවා ගන්නා ලදි. අනු, මනු, දිනුගේ නව ලාභ/අලාභ අනුපාතය පිළිවෙලින් 2:2:1 කි. දිනු බඳවා ගැනීමේදී කීර්තිනාමය රු. 300 000 කට ඇස්තමේන්තු කර ප්‍රාග්ධන ගිණුම් වල ගලපන ලදී.

1. කීර්තිනාමය ගැලපීමෙන් ''දිනුගේ'' හිමිකම කීයකින් අඩු වේද? ....

2. නව හවුල් කරුවෙකු බඳවා ගැනීමේදී කීර්තිනාමය ඇස්තමේන්තු කර ගැලපීමට හේතුව කුමක්ද?

....

....

- ප්‍රශ්න අංක 41 හා 42 ට පිළිතුරු සැපයීම සඳහා පහත තොරතුරු භාවිතා කරන්න.

3:2 අනුපාතයට ලාභ අලාභ බෙදා ගනිමින් ගයාෂා හා අමාෂා විසින් පවත්වාගෙන ගිය හවුල් ව්‍යාපාරයට 2018.03.31 මලීෂා නව හවුල් කරුවෙකු ලෙස බඳවා ගන්නා ලදි. මලීෂාට ලාභයෙන් 1/6 ක් ලබා දීමට එකඟ විය. එදිනට කීර්ති නාමය රු. 600 000 කට ඇස්තමේන්තු කර ඇත, 2017.04.01. දිනට ජංගම ගිණුම්වල ශේෂ ගයාෂා රු. 150 000 ක් සහ අමාෂා රු. 90 000 කි. 2018.03.31 දිනට ගයාෂාට හිමිවූ ලාභ කොටස රු. 360 000 කි.

41. කීර්ති නාමය වාර්තා කිරීමට අවශ්‍ය ජ'නල් සටහන් ලියන්න. (සංලක්ෂය අවශ්‍ය නොවේ.)

....

....

....

....

....

42. 1. 2018.03.31 දිනට අමාෂාගේ ජංගම ගිණුමේ ශේෂය කීයද? ....

2. මලීෂා විසින් රු. 500 000 ක් මුදලක් රැගෙන ආවේ නම් එදිනට ඇයගේ ප්‍රාග්ධන ගිණුමේ ශේෂය කොපමණද?

....

43. පහත ගනුදෙනු පොදු ලෙජරයට පිටපත් කිරීම කරනු ලබන ගිණුම් සඳහන් කරන්න.

	හර	බැර
A ණය හිමියන්ගෙන් ලැබූ වට්ටම්	....	....
B ණය පදනම මත භාණ්ඩ විකිණීම	....	....

44. ව්‍යාපාරයක 2018.03.31 දිනට ණය ගැති ලෙජරයේ ශේෂ වල එකතුව රු. 250 000 වූ අතර එදිනට ණයගැති පාලන ගිණුමේ ශේෂය ඊට එකඟ නොවීය. පසුව පහත දෑ අනාවරණය විය.

- රු. 21 000 විකුණුම් ණයගැති ලෙජරයේ සටහන් කර ඇත්තේ රු. 12 000 ලෙසය.
- රු. 5 000 ක ආපසු එවුම් ණයගැති පාලන ගිණුමේ සටහන් කර නැත.
- ණය ගැති පාලන ගිණුම ආරම්භක හර ශේෂය රු. 1000 ක් අඩුවෙන් සටහන් කර ඇත.

ඉහත වැරදි නිවැරදි කිරීමට පෙර 18/03/31 දිනට ණයගැති පාලන ගිණුමේ ශේෂය කොපමණද? ....

45. පහත වැරදි මගින් ව්‍යාපාරයක ශේෂ පිරික්සුමේ වෙනසක් ''ඇති වේද'' , ''ඇති නොවේද'' යන්න දක්වන්න.

A රු. 80 000 ක ගැනුම් ඉන්වොයිසියක් පොත් වලින් මග හැරීම ....

B රු. 38 000 ක බොල්ණය කපා හැරීම ණයගැති ලෙජරයේ පමණක් සටහන් කිරීම ....

C රු. 20 000 බැංකු අයිරාව රු. 2000 ලෙස ශේෂ පිරික්සුමට ගෙන තිබීම ....

D යන්ත්‍ර සවි කිරීමට වැය වූ රු. 50 000 ක මුදල යන්ත්‍ර නඩත්තු ගිණුමේ සටහන් කිරීම ....

46. ව්‍යාපාරයක් විසින් ගිණුම් වර්ෂයක් තුල මිලට ගන්නා ලද තොග සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

		රු.
ලකුණු කළ මිල රු. 5000 බැගින් ඒකක 100		500 000
ගෙන ඒමේ කුලි		50 000
ගෙන යාමේ කුලි		25 000
ඉතිරි තොගය	ඒකක 10	
අඩු කල වෙළඳ වට්ටම	5% කි	

වර්ෂය අවසානයේ තොගයේ පිරිවැය කොපමණද? ....

47. විශ්‍රාමිකයන්ගේ සංගමයකට අදාළ වත්කම් හා වගකීම් සම්බන්ධ තොරතුරු පහත දී ඇත.

	2018/03/31	2017/03/31
මුදල්	55 000	28 000
ලිපි ද්‍රව්‍ය	2 000	1 500
කාර්යාල උපකරණ	72 000	80 000
ගෙවිය යුතු දෑ	4 300	3 800

1. 2018/03/31 අවසන් වර්ෂය සඳහා අතිරික්තය සඳහා හෝ ඌණතාවය කොපමණද? රු. ....
2. 2018/03/31 දිනට සමුච්චිත අරමුදල කොපමණද? රු. ....

48. සිත්මිණ නිෂ්පාදන ව්‍යාපාරයේ නිෂ්පාදන පිරිවැය හා සම්බන්ධ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

පාරිභෝජනය කල ද්‍රව්‍ය පිරිවැය	රු. 1300 000
සෘජු වැටුප්	රු. 600 000
වෙනත් සෘජු වියදම්	රු. 400 000
නිෂ්පාදන පොදු කාර්යය වියදම	රු. 700 000

නිෂ්පාදිතය යෙදූ අමුද්‍රව්‍ය මත පදනම්ව යෙදවුම් වලින් 75% කි. (යෙදූ අමුද්‍රව්‍ය ප්‍රමාණය ඒකක 100 000කි) නිෂ්පාදන මිල කිරීමේදී පිරිවැයට 50% ක ලාභ අතිරික්තයක් එකතු කිරීම ව්‍යාපාරයේ ප්‍රතිපත්තියයි.

ඒ අනුව,

1. ඒකක නිෂ්පාදන පිරිවැය කීයද? ....
2. නිෂ්පාදිත භාණ්ඩ ඒකකයක ලකුණු කල මිල කීයද? ....

49. ව්‍යාපාරයක 2018.03.31 දිනට අවසන් තොගයේ පිරිවැය රු. 240 000 කි. පහත විකල්ප අවස්ථාවල අනුව දී ඇති වගුව සම්පූර්ණ කරන්න.

1. තොගයේ ශුද්ධ උපලබ්ධි අගය රු. 200 000 සහ
2. තොගයේ ශුද්ධ උපලබ්ධි අගය රු. 250 000 වන විටදී,

විකල්පය	විකුණුම් පිරිවැය ගණනය කිරීමේ දී	මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ පෙන්විය යුතු අගය	ලාභයට කරන බලපෑම
(1)			
(2)			

50. ණයගැතියෙකු විසින් රු. 80 000 ක් පියවීම සඳහා රු. 76 000 ක චෙක්පතක් බැංකු ගිණුමට ප්‍රේෂණය කර ඇත. මෙම චෙක්පත, අඟරු වී ඇති බව බැංකුව විසින් දන්වා තිබුනි. ඉහත චෙක්පත අඟරු වීමට අදාල ද්විත්ව සටහන ලියා දක්වන්න. (වට්නාකම සහිතව) ....

....

....

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) 12 ශ්‍රේණිය තෙවන වාර පරීක්ෂණය, 2018 ජූලි
கல்விப் பொதுத் தராதர (உயர்தரப்) பரீட்சை 2018 ஜீலை, தரம் 12 மூன்றாம் தவணைப் பரீட்சை
General Certificate of Education (Adv. Level), Grade 12 Third Term Test, 2018 July

ගිණුම්කරණය - II
Accounting - II

33 S II

පැය තුනයි
03 hours

උපදෙස් • පළමුවන හා දෙවන ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න හයකට පමණක් පිළිතුරු සපයන්න.
• අදාළ පෙරවැඩ, පිළිතුරු පත්‍රය සමග අමුණන්න.

01. අමර හා නයනාගේ හවුල් ව්‍යාපාරයේ 2017/03/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පහත දැක්වේ. (රු.'000)

ජංගම නොවන වත්කම්	පිරිවැය	සමුච්චිත ක්ෂය	ධාරණ අගය
දේපළ පිරියත හා උපකරණ	3000	1000	2000
15% ස්ථාවර තැන්පතු			1000
ජංගම වත්කම්			
වෙළඳ තොගය		525	
වෙළඳ ලැබිය යුතු දෑ	500		
අඩමාණ ණය වෙන් කිරීම	(25)	475	
බැංකු ශේෂය		1000	2000
			5000
හිමිකම් හා වගකීම්			
ප්‍රාග්ධන ගිණුම් අමර		1000	
නයනා		800	
ජංගම ගිණුම් අමර		250	
නයනා		(50)	
මුළු හිමිකම			2000
ජංගම නොවන වගකීම්			
15% බැංකු ණය		500	
5% අමරගේ ණය		500	1000
ජංගම වගකීම්			
වෙළඳ ගෙවිය යුතු දෑ		700	
ගෙවිය යුතු වැට් (VAT)		1300	
			2000
			5000

පහත අතිරේක තොරතුරු දී ඇත.

1. 2017/04/01 වන දින සාමා හවුල්කරුවෙකු ලෙස බඳවා ගත් අතර, නව හවුල් ගිවිසුමේ පහත එකඟතාවයන්ට එළඹී ඇත.
   - අමර, නයනා, සාමා අතර ලාභාලාභ අනුපාතය පිළිවෙළින් 2:2:1 වේ.
   - ගලපන ලද ප්‍රාග්ධන ශේෂ මත වාර්ෂිකව 10%ක පොලියක් ගෙවීම.
   - සෑම හවුල්කරුවෙකුටම මසකට රු. 10,000ක වේතනයක් ගෙවීම.
2. සාමා පැමිණි දින ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 300,000ට ඇස්තමේන්තු කර ඒ මගින් ඇති වන බලපෑම ප්‍රාග්ධන ගිණුම් තුළ ගැලපීමට තීරණය විය.
3. සාමා මුදලින් රු. 500,000 ද රු. 100,000 ක් වූ මෝටර් සයිකලයක්ද, රු. 50,000ක වෙළඳ බඩු තොගයක් ද රැගෙන එන ලදී.

4. 2018/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ ලාභය රු. 470 000ක් වූ අතර, ආදායම් ප්‍රකාශය පිළියෙළ කිරීමේ දී පහත දෑ නො සලකා ඇත.

(i) රු. 1000 000ක ඉඩම සහිත, දේපල පිරියත හා උපකරණ පිරිවැය මත ක්ෂය 10%කි.
(ii) ණයගැති ශේෂය මත අඩමාන ණය වෙන් කිරීම 5%කි.
(iii) සේවකයින්ට ගෙවීමට තීරණය කළ ප්‍රසාද දීමනාව රු. 25000කි.
(iv) පොළිය සමඟ ගෙවූ ණය වාරිකය රු 175 000කි.
(v) අමර සපයා තිබූ ණයවලින් 50%ක් පියවා, අදාළ ණය පොළී සම්පූර්ණයෙන් ම ගෙවා තිබුණි.
(vi) ස්ථාවර තැන්පතු පොළී 2018/03/31 දින වන විටත් ගිණුමට බැර කර නො තිබුණි.
(vii) හවුල්කරුවන් සිදු කළ භාණ්ඩ ගැනිලි, අමර රු. 50000, නයනා රු. 25000, සාමා රු. 25000
(viii) පිරිවැය රු. 400 000ක් වූ හා ශුද්ධ උපලබ්ධි අගය රු. 350 000ක් වූ අවසන් තොගයේ ශුද්ධ උපලබ්ධි අගය නොසලකා තිබුණි.

5. හවුල් වේතන හා ප්‍රාග්ධන පොළී හවුල්කරුවන් මුදලින් ලබාගෙන තිබුණි.
6. ආරම්භක ශේෂයට වඩා අවසාන ශේෂ වෙනස් වීම පහත පරිදිය.

වෙළඳ ලැබිය යුතු දෑ අඩුවීම	රු.	200 000කි
වෙළඳ ගෙවිය යුතු දෑ අඩුවීම	රු.	200 000කි

7. 2018/03/31 දිනට වැටි පාලන ගිණුමෙහි හර ශේෂය රු 200 000කි
මුදල් පාලන ගිණුමෙහි බැර ශේෂය රු. 955 000කි.

අවශ්‍ය වන්නේ,

1. 2018/03/31න් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ නිවැරදි ලාභය දක්වෙන ප්‍රකාශනයක්, ලාභ අලාභ විසර්ජනය සහිතව
2. 2018/03/31 දිනට හවුල්කරුවන්ගේ හිමිකම් ගිණුම් (ප්‍රාග්ධන හා ජංගම ගිණුම්)
3. 2018/03/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ලකුණු 20)

02. 2018/03/31 දින හටගත් ගින්නකින් ඒරන්ද ව්‍යාපාරයේ ගිණුම් ලිපිකරු භාවිතා කළ, පරිගණකය විනාශ විය. ලිපිගොනුවකින් පහත තොරතුරු උපුටා ගැනීමට ඒරන්දට හැකිවිය. (රු.'000)

- 2017/03/31 දිනට

මුළු වත්කම්	
දේපල පිරියත හා උපකරණ (ධාරණ අගය)	3000
තොගය	500
වෙළඳ ලැබිය යුතු දෑ	800
මුදල්	200
මුළු වගකීම්	
10% බැංකු ණය	1000
වෙළඳ ගෙවිය යුතු දෑ	500
උපචිත ගොඩනැගිලි කුලී	100

- 2018/03/31 දිනට

දේපල පිරියත හා උපකරණ (ධාරණ අගය)	3000
වෙළඳ ලැබිය යුතු දෑ	900
10% බැංකු ණය	900
වෙළඳ ගෙවිය යුතු දෑ	450
උපචිත ගොඩනැගිලි කුලී	50

2017/04/01 සිට 2018/03/31 දින දක්වා මුදලින් කල ගනුදෙනුවල සාරාංශය (රු.'000 වලිනි)

ණයගැති ලැබීම් (රු 10000ක දුන් වට්ටම් අඩු කල පසු)	6190
ණයහිමියන්ට ගෙවීම්	4675
ගොඩනැගිලි කුලී ගෙවීම්	175
මෙහෙයුම් වියදම් ගෙවීම්	500
ණය ගෙවීම්	100
පරිගණකයක් මිලදී ගැනීම්	200
ණය පොළී ගෙවීම්	10

- 2018/03/31 ඉතිරි වෙළඳ බඩු සියල්ලම ගින්නෙන් විනාශ විය.
- දළ ලාභ ප්‍රතිශතය විකුණුම් මිල මත 20%කි.
- වෙළඳ බඩු තොගය රක්ෂණය කර තිබුණි. හානියකදී පිරිවැයෙන් 80%ක වන්දියක් ගෙවන බවට රක්ෂණ සමාගම එකඟ වී ඇත.
- ගින්නෙන් විනාශ වූ පරිගණකය පිරිවැය රු. 150 000කි
- සියලුම ගැනුම් හා විකුණුම් ණය පදනම මත සිදු කරයි
- ඒරන්දගෙ බිරිඳ නිවසේ පාවිච්චිය සඳහා රු. 10 000ක භාණ්ඩ රැගෙන ගොස් ඇත.

අවශ්‍ය වන්නේ,

1. 2018/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ජිරන්ද ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශනය
2. 2018/03/31 දිනට ජිරන්ද ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ලකුණු 10)

(ii) ව්‍යාපාරයක 2018/01/31 දිනට මුදල් පාලන ගිණුමට අනුව ශේෂය රු. 80 000කි. මෙදිනට බැංකු ප්‍රකාශය අනුව ශේෂය වෙනස් අගයක් දක්නට ලැබුණි. පසුව කරන ලද විමර්ශනයේ දී පහත දෑ අනාවරණය විය.

(i) බැංකුවේ තැන්පත් කළ රු. 40 000 සහ රු. 20 000 චෙක්පත් උපලබ්ධි වී නොතිබුණි.
(ii) සැපයුම්කරුවෙකුට නිකුත් කරන ලද රු. 60 000ක චෙක්පත ගෙවීමට ඉදිරිපත් කර නොතිබුණි.
(iii) බැංකුවට ලැබී ඇති සෘජු ප්‍රේෂණ රු. 28 000කි.
(iv) ව්‍යාපාරයේ කල් බදු වාරිකය වූ රු. 30 000 ස්ථාවර නියෝග මත ගෙවා ඇත.
(v) තැන්පත් කළ රු. 12 000ක චෙක්පත අඟරු වීම සහ බැංකුව අය කල ගාස්තු රු. 800 පොත්වල සටහන් වී නැත.

අවශ්‍ය වන්නේ,

1. 2018/01/31 දිනට සංශෝධිත මුදල් පාලන ගිණුම
2. 2018/01/31 අවසන් දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය (ලකුණු 05)

03. 2018 ජනවාරි මාසය තුළ "විකුම්ගේ ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනුවල බලපෑම පහත ගිණුම් සමීකරණය තුළින් නිරූපනය වේ. (කාලච්ඡේදය තුළ අයිතිකරු කිසිදු මුදලක් ලබා ගෙන නැත.)

(රු.'000)

	වත්කම්				වගකීම්		හිමිකම්	
දිනය	දේපළ පිරියත හා උපකරණ	තොග	වෙළඳ ලැබිය යුතු දෑ	බැංකු මුදල්	බැංකු ණය හා වෙනත් ගෙවිය යුතු දෑ	වෙළඳ ගෙවිය යුතු දෑ	ප්‍රාග්ධනය	රඳවා ගත් ඉපයීම්
18/01/01 ශේෂය	2 500	1 700	800	500	2000	1 000	2000	500
18/01/02		+800				+800		
18/01/05	+750				+750			
18/01/10		-600	+750					+150
18/01/13				-450		-500		+50
18/01/14				-330	-300			-30

පහත සඳහන් ගනුදෙනු ජනවාරි මස 15 වන දිනෙන් පසුව සිදු වී ඇත.

(i) 2018 ජනවාරි 18 විදුලි ගාස්තු වියදම රු. 50 000කි. මෙය ගෙවා ඇත්තේ අයිතිකරු විසිනි.
(ii) 2018 ජනවාරි 20 ණයගැතියෙකුගෙන් ලැබීමට තිබූ රු. 400 000ක් සඳහා ලද මුදල රු. 370 000කි.
(iii) 2018 ජනවාරි 25 විකුම් සතු පරිගණකය ව්‍යාපාර කටයුතු සඳහා ගෙන එන ලද අතර මෙහි වටිනාකම රු. 80 000කි.
(iv) 2018 ජනවාරි 28 රු. 20 000ක් වටිනා තොගයක් ගින්නෙන් විනාශ වූ අතර මේ සඳහා රක්ෂණ වන්දි ලෙස රු. 15 000ක් ලැබුණි.
(v) 2018 ජනවාරි 30 විවිධ වියදම රු. 50 000ක් ගෙවන ලදී.

අවශ්‍ය වන්නේ,

(i) ඉහත ගිණුම් සමීකරණයේ ජනවාරි මස 01 සිට 14 දක්වා ගනුදෙනු වටිනාකම් සහිතව විස්තර කරන්න.
(ii) ජනවාරි මස 15 වන දිනෙන් පසුව සිදු වූ ගනුදෙනු ඉහතින් දක්වා ඇති ගිණුම්කරණ සමීකරණ ආකෘතියෙහි වාර්තා කරන්න.
(iii) 2018/01/31 වන දිනට ශුද්ධ වත්කම් ඇසුරින් ලාභය හෝ අලාභය ගණනය කරන්න. (ලකුණු 15)

04. (1) 2018 මාර්තු මාසයේ "සඳහම් ව්‍යාපාරය" විසින් සිදු කරන ලද ගනුදෙනු පහත දක්වේ.

- මාර්තු 01 ඉ.අ. 125 සමන්ට ණයට විකුණුම් රු. 40 000කි.
- මාර්තු 03 ඉ.අ. 126 විරාජ්ට විකුණුම් රු. 60 000කි. මෙහි වෙළඳ වට්ටම 10%කි.
- මාර්තු 05 සමන්ට විකුණූ භාණ්ඩවලින් රු. 8 000ක භාණ්ඩ ආපසු හරවා එවන ලදී.
- මාර්තු 10 මුදලට විකුණුම් රු. 55 000කි.
- මාර්තු 12 විරාජ්ගෙන් ලද මුදල රු. 15 000ක් වන අතර දුන් වට්ටම රු. 2 000කි.
- මාර්තු 15 ඉ.අ. 49 ණයට ගැනුම් විමල්ගෙන් රු. 25 000කි.
- මාර්තු 18 අත්පිට විකුණුම් රු. 60 000කි.
- මාර්තු 23 ඉ.අ. 127 කුසුම්ට විකුණුම් රු. 80 000කි.
- මාර්තු 25 සමන්ගෙන් ලද මුදල රු. 20 000කි.

- මාර්තු 28 කුසුම්ට විකුණූ භාණ්ඩවලින් 25%ක් ආපසු එවන ලදී.
- මාර්තු 29 ඉ.අ. 666 තමරාගෙන් ණයට ගත් භාණ්ඩ වල වටිනාකම රු. 45 000කි.
- මාර්තු 30 ලද වෙනත් ආදායම රු. 12 000කි.

අවශ්‍ය වන්නේ,

(i) ඉහත ගනුදෙනු මූලික සටහන් පොත්වල වාර්තා කරන්න. (ලකුණු 05)

(2) "රුවනිගේ ව්‍යාපාරය" 2018.03.01 වන දින ආරම්භ කරන ලදී. (රු.'000 වලින්)

ණය හිමියෝ	ණයට ගැනුම්	ආපසු යැවුම්	ලද වට්ටම	මුදල්
කුසල්	2200	200	100	1000
තුසල්	950	–	50	400
විසල්	700	100	60	300
	3850	300	210	1700

පහත අතිරේක තොරතුරු දී ඇත.

2018/03/31 දිනට ණයහිමි ලෙජරයේ ශේෂය එදිනට අදාළ පාලන ගිණුමේ ශේෂය සමඟ සම නොවීය. පසුව පහත වැරදි හෙළිදරව් කර ගන්නා ලදී.

1. විසල්ට ආපසු යැවූ රු. 100 000ක භාණ්ඩ ණයහිමි ලෙජරයේ සටහන් වී තිබුණේ රු. 10 000ක් ලෙසය.
2. රු. 200 000 ක අත්පිට ගැනුම් ණයහිමි පාලන ගිණුමට බැර කර ඇත.
3. කුසල්ට ආපසු යැවූ රු. 200 000ක් තුසල්ගේ ගිණුමට බැර කර ඇත.
4. ගැනුම් ජර්නලයේ එකතුව ණයහිමි පාලන ගිණුමට හා ගැනුම් ගිණුමට පිටපත් කර ඇත්තේ රු. 3 580 000ක් ලෙසටය.
5. ලද වට්ටම් රු. 210 000 ලද වට්ටම් ගිණුමට බැර කර ඇත්තේ රු. 310 000ක් ලෙසටය.
6. කුසල්ට ගෙවූ රු. 400 000ක මුදල පොදු ලෙජරයේ පමණක් සටහන් කර ඇත.

අවශ්‍ය වන්නේ,

1. ඉහත වැරදි නිවැරදි කිරීමට අදාළ ජ'නල් සටහන් (සංලක්ෂ්‍ය සහිතව)
2. ණයහිමි පාලන ගිණුමේ ශේෂය සමග ණයහිමි උපලෙජරයේ ශේෂය සමග සැසඳීමේ ලේඛනය (ලකුණු 10)

05. 1) වේරගම මහතා කේවල ස්වාමි ව්‍යාපාරයක අයිතිකරුවෙකි. 2018/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපාරයේ මුදල් පාලන ගිණුමෙන් උපුටා ගන්නා ලද තොරතුරු පහත දක්වා ඇත.

මුදල් පාලන ගිණුම (රු.'000)

ඉ./ගෙ. ශේෂය	180 000	ණයහිමියන්ට ගෙවීම්	1 340 000
ණයගැති ලැබීම්	2 850 000	වාහන ධාවන වියදම්	320 000
		වැටුප් හා වේතන	380 000
		පරිපාලන වියදම්	87 000
		බෙදාහැරීමේ වියදම්	63 000
		මූල්‍ය වියදම්	24 000
		වෙනත් වියදම්	48 000
		ශේෂය ප/ගෙ	768 000
	3 030 000		3 030 000

2. 2017/04/01 දිනට ප්‍රාග්ධන ගිණුමේ ශේෂය රු. 836,000 ක්වූ අතර 2017/04/01 සහ 2018/03/31 දිනට පහත දක්වෙන වගකීම් දක්නට ලැබුණි.

	2018/03/31	2017/04/01
මෝටර් රථ (ශුද්ධ අගය)	600,000	650,000
වෙළඳ ලැබිය යුතු දෑ (ණයගැති)	405,000	320,000
වෙළඳ ගෙවිය යුතු දෑ (ණයහිමි)	567,000	324,000

3. වර්ෂය තුළ වත්කම් අත්පත් කර ගැනීමක් හෝ ඉවත් කිරීමක් සිදුකර නැත.
4. 2017/12/31 දින බොල්ණය වශයෙන් රු. 50 000ක් කපාහැර ඇත.
5. කාලපරිච්ඡේදය තුළ ආපසු යැවූ භාණ්ඩවල වටිනාකම රු. 37,000ක් වූ අතර ණය ගැතියන් විසින් රු. 21,000 භාණ්ඩ තොග ආපසු එවා තිබුණි.
6. වේරගම මහතා විසින් 2018/01/01 දින ව්‍යාපාරය වෙනුවෙන් රු. 60 000 රක්ෂණ වියදමක් පෞද්ගලික මුදලින් ගෙවා තිබුණි.

5060

7. 2018/03/31 දින ණයගැතියකු විසින් රු. 95 000ක් බැංකුවේ තැන්පතු කර තිබූ අතර ඒ බව ෆැක්ස් පණිවිඩයක් මගින් ව්‍යාපාරය වෙත දන්වා ඇත. රු. 5 000ක වට්ටමක් ඔහුට ලබාදීමට තීරණය කරන ලදී.

8. භාණ්ඩ තොගයක් මිලට ගැනීම සඳහා අත්තිකාරම් මුදල් වශයෙන් රු. 30 000ක මුදලක් ව්‍යාපාරයේ බැංකු ගිණුමේ තැන්පත් කල බව 2018/03/20 දින ගණුදෙනුකරුවකු විසින් දන්වා ඇත. ගැනුම් හා විකුණුම් සියල්ලම ණය පදනම මත සිදු කරනු ලබයි.

(i) ඉහත තොරතුරු පදනම් කරගනිමින් 2018/03/31 දිනට වේරගම ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම සකස් කිරීම.

(ලකුණු 10)

2. "විකසිත ව්‍යාපාරයේ" 2018 මාර්තු මාසය සඳහා සේවකයින්ගේ වැටුප් හා වේතනවලට අදාල පහත සඳහන් තොරතුරු ඔබට දී ඇත.

සේවකයාගේ නම	මූලික වැටුප	දීමනා
සමාරා	60 000	40 000
තමාරා	50 000	20 000
පමාරා	40 000	30 000
එකතුව	150 000	90 000

අතිරේක තොරතුරු

1. සේවක අර්ථ සාධක අරමුදල (EPF) සඳහා සේව්‍ය හා සේවකයාගේ දායකය, මූලික වැටුප මත පිළිවෙළින් 12%ක් 8% වේ.
2. සේවක භාර අරමුදල (ETF) සඳහා දායකත්වය 3%කි.

අවශ්‍ය වන්නේ,

(i) සේවක වැටුප් හා වේතන පාලන ගිණුම

(ii) ගෙවිය යුතු (EPF) සහ (ETF) ගිණුම් (ලකුණු 05)

06. (i) ක්‍රීඩකයින්ගේ අභිවෘද්ධිය අරමුණු කරගනිමින් පවත්වාගෙන යනු ලබන "ශක්ති" ක්‍රීඩා සමාජයට අදාලව 2017/04/01 දිනට උපුටා ගන්නා ලද වත්කම් හා වගකීම් පහත දක්වා ඇත.

(රු.'000 වලිනි)

<u>ජංගම නො වන වත්කම්</u>		
ක්‍රීඩාගාරය	700	
ව්‍යායාම උපකරණ	800	
ලීබඩු හා කාර්යාල උපකරණ	300	1800
<u>ජංගම වත්කම්</u>		
ලැබිය යුතු සාමාජික මුදල්	84	
මුදල් ශේෂය	180	264
<u>ජංගම නොවන වගකීම්</u>		
යාවජීව සාමාජික මුදල්	500	
ව්‍යායාම උපකරණ අරමුදල	700	1200
<u>ජංගම වගකීම්</u>		
කලින් ලද සාමාජික මුදල්	90	
ගෙවිය යුතු විදුලි ගාස්තු	65	155

2018/03/31 අවසන් වර්ෂය අදාල තොරතුරු පහත දක්වේ.

1. සාමාජිකයකුගේ වාර්ෂික සාමාජික මුදල රු. 6 000කි. සංගමයේ සාමාජික සංඛ්‍යාව 120කි. ඊට අමතරව රු. 12 000ක් බැගින් යාවජීව සාමාජික මුදල් ගෙවූ සාමාජික සංඛ්‍යාව 50කි. වර්ෂයකට යාවජීව සාමාජික මුදල් වලින් රු. 100 000 වටිනාකමක් සාමාජික මුදල් ආදායම ලෙස සැලකීම සංගමයේ ප්‍රතිපත්තියයි.
2. වර්ෂය තුළ සාමාජිකත්වයේ වෙනසක් සිදු නොවූ අතර 2018/03/31 වන විට සාමාජික මුදල් නොගෙවූ සාමාජිකයින් 20 දෙනකු සිටි අතර සාමාජිකයින් 10ක් ඉදිරි වර්ෂයට අදාළව සාමාජික මුදල් ගෙවා තිබුණි.
3. සාමාජිකයින්ට මෙන්ම බාහිර පාර්ශවයන්ට කාය වර්ධන පහසුකම් ලබා ගැනීමට හැකියාව තිබෙන අතර දිනකට එක් අයකුගෙන් රු. 250ක ගාස්තුවක් අයකරනු ලබයි. එවන් පුද්ගලයින් 50ක් දින 80ක් තුළ අදාළ පහසුකම ලබාගන්නා ලදී. ඉදිරි වර්ෂය සඳහා අදාළ පහසුකම් ලබාගැනීම සඳහා අත්තිකාරම් වශයෙන් රු. 80 000ක මුදලක් ලබා දී තිබුණි.
4. සේවකයින්ගේ වැටුප් රු. 240 000කි. අදාල සියලු වැටුප් මුදලින් ගෙවා ඇත. වෙනත් වියදම් වශයෙන් රු. 270 000ක් ගෙවන ලදී. ගෙවූ විදුලි ගාස්තුව රු. 315 000කි.
5. ක්‍රීඩාගාරය 10%ක් ද, ව්‍යායාම උපකරණ 5%ක් ද, ලී බඩු උපකරණ 25%ක් ද බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතුය.
6. උපකරණ නඩත්තු වියදම රු. 8 000ක් ගෙවූ අතර රු. 20 000ක් ගෙවිය යුතුව ඇත.
7. රු. 36 000ක මුදල් ශේෂයක් රඳවාගෙන ඉතිරි සියළු මුදල් ස්ථාවර තැන්පතු ගිණුමක තැන්පත් කරන ලදී.

අවශ්‍ය වන්නේ,

1. 2017/04/01 දිනට සමුච්චිත අරමුදල දක්වෙන ප්‍රකාශයක්
2. 2018/03/31 අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය
3. 2018/03/31 දිනට බැංකු ගත කළ මුදල සහ එදිනට ජංගම වගකීම් වල වටිනාකම (ලකුණු 15)

07. 1. ''සනිරෝ'' ගාමන්ට් ආයතනයේ 2018/03/31 දිනෙන් අවසන් වර්ෂයට අදාළව තොරතුරු කිහිපයක් පහත දක්වේ.

	(රු.'000 වලින්)
ආරම්භක තොග අමුද්‍රව්‍ය	4 300
නොනිමි	2 700
නිමි භාණ්ඩ	7 000
අමුද්‍රව්‍ය ගැනුම්	18 700
ගෙන ඒමේ කුලී	300
ආපසු යැවුම්	700
වැටුප් (සෘජු)	7 300
සුපරීක්ෂක වේතන	1 700
කම්හල් විදුලිය	1 600
කම්හල් රක්ෂණය	500
යන්ත්‍ර පිරිවැයට	12 000
නඩත්තු වියදම්	3 200
අළුත්වැඩියා වියදම්	1 100
මෝස්තර නිර්මාණ වියදම	1 200
වෙනත් වියදම්	200

අතිරේක තොරතුරු (රු.'000 වලින්)

1.අවසන් තොග අමුද්‍රව්‍ය 1 400
නොනිමි 1 900
නිමි භාණ්ඩ 6 200

2.වැටුප් රු. 700 සහ කම්හල් රක්ෂණය සඳහා රු. 300ක් ගෙවිය යුතුය

3.නඩත්තු වියදම් වලින් රු. 1 000 ඉදිරි වර්ෂයට අදාල වේ.

4.යන්ත්‍ර පිරිවැය මත 10% බැගින් ක්ෂය කල යුතුය.

අවශ්‍ය වන්නේ,

1. 2018/03/31 අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන පිරිවැය ප්‍රකාශනය
2. ව්‍යාපාරය විසින් නිෂ්පාදන ඒකක 10 000ක් වර්ෂය තුළ නිෂ්පාදනය කලේ නම් නිෂ්පාදන ඒකකයක පිරිවැය

(ලකුණු 10)

(ii) ''සැම්සන් ව්‍යාපාරයේ'' 2018/03/31 දිනට පැවති ජංගම නොවන වත්කම් වලට අදාල තොරතුරු කිහිපයක් පහත දක්වා ඇත.

වත්කම	අත්පත් කරගත් දිනය	පිරිවැය	සුන්බුන් අගය	ඵලදායී ජීව කාලය
යන්ත්‍ර	2015/07/01	1 120 000	120 000	වසර 10
වාහන	2016/01/01	1 400 000	200 000	වසර 08
ලී බඩු හා උපකරණ	2017/04/01	340 000	40 000	වසර 05

සැම්සන් ව්‍යාපාරය 2018/04/01 දිනට වෙනත් ව්‍යාපාරයකට විකිණීමට තීරණය කරන ලද අතර එදිනට ඉහත වත්කම්වල ශුද්ධ අගය ගණනය කර ගැනීමට ඔබගේ සහය අපේක්ෂා කරයි. එක් එක් වත්කම් වෙන් වෙන් වශයෙන් සලකන්න.
අවශ්‍ය වන්නේ,
2018/03/31න් අවසන් වර්ෂය සඳහා

(i) එක් එක් වත්කමට අදාළ ක්ෂය වෙන් කිරීමේ ගිණුම් පිළියෙළ කිරීම
(ii) එක් එක් වත්කම්වල ධාරණ අගයන් ගණනය කිරීම (මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ උද්ධෘත) (ලකුණු 05)